# බළන්ගොඩ නගර සභාව

## 2020-10-27 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** - 2020.10.27

**වේලාව** - පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් විකුමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනී | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. 2021 වර්ෂයට අදාළව සභා දේපළ ටෙන්ඩර් කිරීම සඳහා ටෙන්ඩර් පත් විවෘත කිරීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බැවින් ඒ සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි'

ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් නැවත වරක් ගරු සභාපති ඉදිරිපත් කරන ලදි.

- 2020 වර්ෂය සඳහා පොදු වෙළඳසැල් අංක 15 දරණ එළුමස් කඩ කාමරය සඳහා ටෙන්ඩර් පත් තුනක් නිකුත්කර තිබූ අතර, ඒ අතරින් ටෙන්ඩර්පත් දෙකක් පමණක් ලැබී තිබුණි. එහිදී රු. 32,800.00 ක වැඩිම ලංසු මුදල ඉදිරිපත් කර තිබූ ඒ. එම්. එම්. රෙමීෂින් මහතා විසින් එම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කළ බැවින් දෙවන ටෙන්ඩර්කරු වන එෆ්. එම්. රවුෂාන් මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු. 27,500.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- 2021 වර්ෂය සඳහා පොදු වෙළඳසැල අංක 16 දරණ ගවමස් කඩ කාමරය සඳහා ටෙන්ඩර්පත් දහ තුනක් නිකුත්කර තිබූ අතර, ඒ අතරින් ටෙන්ඩර්පත් එකොළහක් පමණක් ලැබී තිබුණි. එහිදී රු. 799,991.66 ක වැඩිම ලංසු මුදල ඉදිරිපත් කර තිබූ එම්. එම්. එම්. ඉන්තියාස් මහතා විසින් එම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කල බැවින් දෙවන ටෙන්ඩර්කරු වන අංක 351ඒ, දෙහිගස්තලාව, බළන්ගොඩ පදිංචි ඒ. එම්. එම්. රෙමීෂින් මහතා විසින් ඉදිරිපත් කර තිබූ රු. 716,658.33 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- 2021 වර්ෂය සඳහා පොදු වෙළඳසැල අංක 17 දරණ කුකුල් මස්කඩ කාමරය සඳහා ටෙන්ඩර්පත් දෙකක් නිකුත් කර තිබූ අතර, ඒ අතරින් එක් ටෙන්ඩර්පතක් පමණක් ලැබී තිබුණි. එහි ලංසු මුදල ලෙස රු. 34,800.00 ක මුදලක් දක්වා තිබූ 132/88, අළුපොත පදිංචි ජේ. බදුර්දීන් මහතාගේ ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- 2021 වර්ෂය සඳහා මහජන පොළ ආපන ශාලාව සඳහා ලංසුපත් දෙකක් නිකුත් කළ අතර එම ලංසුපත් දෙකම ලැබී තිබුණි. ඉන් වැඩිම ලංසුව ගිල්මා, බෙලිහුල්ඔය ලිපිනයේ පදිංචි එම්. දමයන්ති පෙරේරා මහත්මිය විසින් ඉදිරිපත් කර තිබූ රු. 14,100.00 ක මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- 2021 වර්ෂය සඳහා බළන්ගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු අයකිරීම සඳහා ලංසුපත් පහක් නිකුත්කර තිබූ අතර එම ලංසුපත් පහ ලැබී තිබුණි. එහි ලංසුව ලෙස බෝවත්ත, රජවක

ලිපිනයෙහි පදිංචි වී. සී. සඳරුවන් වීරසේකර මහතා රු. 167,300.00 මුදලක් දක්වා තිබූ අතර එම ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- 2021 වර්ෂය සඳහා බළන්ගොඩ බස් නැවතුම්පොළ පෞද්ගලික බස්ගාල් ගාස්තු අයකිරීම සඳහා එක් ලංසුපතක් නිකුත් කර තිබූ එම ලංසුපත ලැබී තිබුණි. එහි ලංසු මුදල ලෙස රු. 110,550.00 ක මුදලක් දක්වා තිබූ අංක 42, අනඳමෙත්ගම පදිංචි නාමල් සේනානායක මහතාගේ ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- 2020-11-15 වන දින සිට 2021-11-14 වන දින දක්වා සභාව සතු දැන්වීම් පුවරු දහය සඳහා ටෙන්ඩර් එකක් පමණක් නිකුත් කළ අතර එම ලංසුපත ලැබී තිබුණි. එහි ලංසු මුදල ලෙස රු. 305,000.00 ක මුදලක් දක්වා තිබූ පූජාපිටිය, වලේබොඩ පදිංචි පී. කේ. මහින්දසේන මහතාගේ ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

- 2020-11-01 වන දින සිට 2021-10-31 වන දින දක්වා බළන්ගොඩ නගරය පවිත්‍ර කිරීම සඳහා ටෙන්ඩර් පත් හතක් නිකුත් කර තිබූ අතර ඉන් ටෙන්ඩර් පත් පහක් ලැබී තිබුණි. එහි අවම ලංසු මුදල ලෙස රු. 640,100.00 ක මුදලක් ඉදිරිපත් කර තිබූ 75/11, වෙව්නෝල් පාර, බළන්ගොඩ පදිංචි විනෝදිකා ප්‍රේමිකා මහත්මියගේ ලංසුව පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගන්නා තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් නැවත සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තූතිව පුදකරමින් ප.ව. 12.00 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.